**ශීර්ෂය 273- පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රජයේ ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය වශයෙන් රජයේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුව ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(ඇ) එක් එක් අවස්ථාවල දී පනවන ලද ව්‍යවස්ථාපිත අණපනත්වලින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

(ඈ) ජනතාවගේ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත්, ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් රජයේ ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

(ඉ) රජයේ විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශවල දිස්ත්‍රික්කයේ ප්‍රධාන නියෝජිත ආයතනය වශයෙන් ඔවුන්ගේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(ඊ) රජයේ ආදායම් ගණන්දීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා වශයෙන් රජයේ ආදායම් එකතු කිරීම හා ගිණුම් ගත කිරීමේ කටයුතුවල නිරතවීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) වෙන්නප්පුව
(ආ) නාත්තන්ඩිය
(ඇ) හලාවත
(ඈ) ආරච්චිකට්ටුව
(ඉ) පුත්තලම
(ඊ) කල්පිටිය
(උ) වනාතවිල්ලුව
(ඌ) කරුවලගස්වැව
(එ) නවගත්තේගම
(ඒ) ආණමඩුව
(ඔ) මහකුඹුක්කඩවල
(ඕ) දංකොටුව
(ක) මාදම්පේ
(බ) පල්ලම
(ග) මුන්දලම
(ස) මහවැව

**1.3 විගණන විෂය පථය**

----------------------

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන, මෙහි (අ) සිට (ඌ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය 2014 මාර්තු 31 දින වන විට විගණනය ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාසයක ප්‍රමාදයකින් පසුව 2014 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබූ බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාල රෙගුලාසිය** |
|---|---|---|
| (i) | පාඩු පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනය හා වැය ලෙජර් | මුදල් රෙගුලාසි 445 |
| (iii) | වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා | මුදල් රෙගුලාසි 1645 සහ 1646 |
| (iv) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (v) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

-------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන දෙකක් අනතුරට පත්වීමෙන් රු.77,850 ක අලාභහානියක් සිදු වී තිබුණි. එම අලාභහානිය පොත්වලින් කපා හැර තිබුණත්, ඒ සඳහා ලබාගත යුතුව තිබුණු භාණ්ඩාගාර අනුමැතිය විගණනය ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරුදීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට 2014 අගෝස්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.23,829,072 ක් විය.

**(ඉ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදන හා වියදම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් සළසා තිබු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.566,163,079 ක් වු අතර , සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.563,385,099 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.2,777,980 ක් හෙවත් සියයට 0.5 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 502,963,079 | 501,956,463 | 1,006,616 | 0.2 |
| මුලධන | 63,200,000 | 61,428,636 | 1,771,364 | 2.8 |
| **එකතුව** | **566,163,079** | **563,385,099** | **2,777,980** | 0.5 |

**(ii) අයවැය විචලනය**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයන් 14 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 04 සිට සියයට 79 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- ප්‍රාග්ධන වැය විෂයයක් හා පුනරාවර්තන වැය විෂයයක් වෙනුවෙන් මුදල් රෙගුලාසි 66 හා 69 විධිවිධාන යටතේ රු.2,020,767 ක ප්‍රතිපාදන මාරුකර තිබුණ ද, එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසානයට

රු.782,422 ක් ඉතිරිව තිබුණි. එම ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක් ලෙස ද, මාරු කළ ප්‍රතිපාදනවලින් සියයට 39 ක්ද වී තිබුණි.

**(iii) අත්හැරීම්**

2001 හා 2005 වර්ෂයන්හි දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් පොත්වලින් කපා නොහල අලාභහානිවල වටිනාකම රු.77,850 ක් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

**(iv) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 17ක් විසින් එකතුව රු.643,040,178 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.160,588,771 ක් හා රු.408,624,623 ක් වශයෙන් එකතුව රු.569,213,394 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.46,506,832 ක් හා රු.27,319,952 ක් වශයෙන් එකතුව රු.73,826,784 ක හෙවත්, ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 22 ක් හා සියයට 6 ක ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඊ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27301 | 40,000,000 | 30,866,915 | 30,000,000 | 63,368,643 | 184,000,000 | 135,099,774 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තිකාරම් ගිණුමට අදාල 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,683,799 ක් වූ අතර, එම හිඟහිටි ශේෂවලින් රු.1,506,807 ක ණය ශේෂ 2014 අගෝස්තු වනවිට අයකර ගෙන තිබුණි.

(ii) 2012 දෙසැම්බර් 31 දිනැති අංක 157 දරන හා 2013 ජනවාරි 31 දිනැති අංක 157(1) දරන ජාතික අයවැය චක්‍රලේඛ සහ 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එක් නිලධාරියෙකු වෙත ගෙවිය හැකි උපරිම ආපදා ණය මුදල රු.250,000 ක් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක නිලධාරීන් 07දෙනෙකු වෙත එම සීමාවන් නොසළකා ණය ලබා දී තිබුණි.

(iii) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමට අදාලව මුදල් රෙගුලාසි 506(ඩී) ප්‍රකාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් සකස් කර එවා තිබූ වාර්තා 03 ක කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂයන් අතර රු.67,041 ක වෙනසක් විය.

(iv) අයකර ගත යුතු වෙනත් ශේෂයන් අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව රු.678,299 ක් වූ හඳුනා නොගත් ශේෂයන් විය. එයින් 2014 අගෝස්තු වන විට රු.125,100 ක් නිරවුල් කරගෙන තිබුණි.

**(උ) අග්‍රිම ගිණුම**

-------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අග්‍රිම ගිණුමෙහි 2013 දෙසැම්බර් 31 දිනට හර ශේෂය රු.62,941,846 ක් විය. ඇයට කිරුළ සංවර්ධන යෝජනාවලට අදාලව ලබා ගෙන තිබුණු මෙම අග්‍රිම ශේෂය 2013 දෙසැම්බර් 31 දින පියවිය යුතු වුවත්, එය මාස 09 ක ප්‍රමාදයකින් පසුව භාණ්ඩාගාරය වෙත 2014 සැප්තැම්බර් 30 දින පියවා තිබුණි.

**(ඌ) පොදු තැන්පත් ගිණුම**

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.303,680,344 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අදාල කල් ඉකුත් වූ එකතුව රු.23,839,080 ක් වූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-------------------------------------

### 1.6.1 අභ්‍යන්තර විගණනය

----------------------

සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාලව අභ්‍යන්තර විගණන විමසුම් 04 ක් නිකුත් කර තිබූ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**1.6.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

**1.7 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් මෝටර් වාහන දෙකක් වර්ෂය මුළුල්ලේ නිෂ්කාර්යව තබා තිබුණි.

(ii) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙහෙයවන ලද **"එක ගමකට එක වැඩක්"** ව්‍යාපෘතිය යටතේ මානිංගල ජල ව්‍යාපෘතියට අදාලව 2011 වර්ෂයේ දී රු.718,010 ක් වැයකර ළිඳක් ඉදිකර තිබුණි. 2012 "ගම නැඟුම ව්‍යාපෘතිය" යටතේ රු.939,000 ක් වැය කර මේ සඳහා ජල පොම්පයක් මිලට ගෙන තිබූ අතර, 2013 වර්ෂයේ දී "වයඹ පුබුදුව ව්‍යාපෘතිය" යටතේ ඒ සඳහා රු.170,000 ක් වැයකර ජල නල ද මිලදී ගෙන තිබුණි. 2014 මාර්තු විගණන අවස්ථාව වන විටත්, මෙම සම්පත් කිසිදු කටයුත්තකට ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවැතුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්ව තිබූ ගොඩනැගිලි දෙකක් බාහිර පාර්ශවයන් වෙත මුදා හැර තිබූ නමුත්, ඒ සඳහා කිසිදු මුදලක් අය කර නොතිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ එකට අඩු කාලයක සිට පැවැත එන බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.11,201,635 ක් වී තිබුණු අතර, එම බැරකම් 2014 වර්ෂයේදී නිරවුල් කර තිබුණි.

## 1.8 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XII වන පරිච්ඡේදයේ 1 වගන්තිය | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන් 15 දෙනෙකු ක්ෂේත්‍ර නිලධාරීන් 09 දෙනෙකු හා ග්‍රාම නිලධාරීන් 14 දෙනෙකු විසින් 2013 වර්ෂයේදී ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධාන වලට පටහැනිව නිවාඩු ලබාගෙන තිබුණි. |
| **(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| • මුදල් රෙගුලාසි 94(1) | මුලධන වැය විෂයයක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසුව ඉතිරිය රු.323,784 ක් වී තිබුණත්, එම ඉතිරිය රු.9,915,836 කින් ඉක්මවා රු.10,239,620 ක බැරකම්වලට එළඹ තිබුණි. |
| • මුදල් රෙගුලාසි 1645 හා 1646 | සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය භාවිතා කළ වාහන 11 කට අදාලව දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| 2012 ජුනි 29 දිනැති | |

| | |
|---|---|
| අංක 13/2012 දරන චක්‍රලේඛයේ 2:1 ඡේදය | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් දෙදෙනෙකු වසර 06 කට වඩා වැඩි කාලයක සිට අඛන්ඩව රාජකාරිවල නිරතව සිටි බව නිරීක්ෂණය විය. |

(iv) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

**------------------------**

| | |
|---|---|
| 2009 සැප්තැම්බර් 18 දිනැති අංක පීඑෆ් 437 දරන චක්‍රලේඛය | රජයේ වාහන ජාතික රක්ෂණ භාරකාර අරමුදලේ හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කළ යුතු වුවද, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 12 ක් ඒ අනුව රක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

(v) **වෙනත් චක්‍රලේඛ**

**------------------ --**

| | |
|---|---|
| 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය | ආණමඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මියගිය විශ්‍රාමිකයන් පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරීන් විසින් වාර්තා නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

**(ආ) බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම**

**---------------------------------------**

2012 නොවැම්බර් 22 දිනැති අංක SD/INF/12/11/09 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්ගේ (මුද්දර බදු) චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2013 වසර සඳහා හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද මත්පැන් බලපත්‍ර දෙකක් සඳහා අය කළ යුතු රු.20,000 ක් බැගින් වූ එකතුව රු.40,000 ක මුද්දර ගාස්තුව, දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 1.9 ගැලපුම් කළයුතු ශේෂ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වු තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 06ට වැඩි වර්ෂ 01ට අඩු | වර්ෂ 01ට වැඩි වර්ෂ 03ට අඩු | |
| | | රු. | රු. | රු. |
| (අ) | උපලබ්ධි නොවු තැන්පතු | 36,048 | -- | 36,048 |
| (ආ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 789,054 | 16,897 | 805,951 |
| (ඇ) | හඳුනා නොගත් බැර | 175,754 | -- | 175,754 |

## 1.10 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පල්ලම, ආණමඩුව, මහකුඹුක්කඩවල, පුත්තලම හා වනාතවිල්ලුව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2013 වර්ෂයේ දී වයඹ පුබුදුව හා විමධ්‍යගත ආයෝජන අරමුදල් වැයකර මිල දී ගෙන තිබු රු.821,730 ක් වටිනා උපකරණ අදාල සංවර්ධන කටයුතු සඳහා බෙදා නොහැර ගබඩාවල රඳවා ගෙන තිබුණි.

(ආ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ, සමාජ සුභසාධන සංවර්ධන කටයුතු සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.109,450 ක් වැයකර විල්පත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත අවස්ථා 4 ක දී විවිධ භාණ්ඩ මිලදී ගෙන භාර දී තිබුණි. එහෙත් බෙදා දුන් භාණ්ඩ ප්‍රදේශයේ තැපැල් කාර්යාලයක හා පෞද්ගලික නිවෙසක රඳවා තිබීමෙන් ඒවා අයථා පරිහරණයට ඉඩකඩ සැලසී තිබුණි.

(ඇ) **"හොඳම දේ දැයේ දරුවන්ටයි"** යන තේමාව යටතේ වූ ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහනේ දී පල්ලම, නවගත්තේගම, වනාතවිල්ලුව හා මහකුඹුක්කඩවල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් බල ප්‍රදේශයන්හි ප්‍රාථමික පාසල්

ප්‍රතිසංස්කරණ කටයුතුවලදී, සාවද්‍ය මිනුම් වාර්තා මත පදනම්ව රු.64,056 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද නවගත්තේගම ප්‍රාථමික විද්‍යාලයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ප්‍රජා දායකත්වය නොසළකා රු.9,018 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආණමඩුව හා නවගත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අනුයුක්ත ග්‍රාම නිලධාරීන් 06 දෙනෙකු විසින් තම ස්ථිර සේවාවට අදාල වසමෙහි මෙන්ම වැඩබලන සේවා වසමෙහි ද එකම දිනයක දී සේවය කළ බව සඳහන් කරමින් මාසික ගමන් වියදම් ලෙස රු.3,150 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

(ඉ) ආණමඩුව හා පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ලබා ගත් විශ්‍රාම වැටුප් ලාභීන් දෙදෙනකු මිය ගොස් තිබුණත්, එකතුව රු.79,179 ක් ඒ අයගේ මාසික විශ්‍රාම වැටුප් වශයෙන් බැංකුව වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ඊ) ආණමඩුව, වනාතවිල්ලුව හා නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විවිධ අරමුදල් යටතේ රු. 262,915 ක් වැයකර අවස්ථා තුනක දී ඉටුකර තිබූ කටයුතු අවශ්‍ය ප්‍රමිතිය, යෝග්‍යතාවය හා අවශ්‍ය පහසුකම් නොමැති වීම යන කරුණු මත එම වියදම නිෂ්කාර්ය වි තිබුණි.

(උ) ස්ථාන මාරුවීම් නොලබා වසර 5 කට වඩා වැඩි කාලයක් ආණමඩුව, පුත්තලම හා නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ යෙදී සිටි නිලධාරීන් සංඛ්‍යාව 17 දෙනෙකු විය.

(ඌ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එරුණුක්කුලිය රජමහ විහාරයේ දහම් පාසල් ගොඩනැගිල්ලෙහි අත්තිවාරම දක්වා වැඩ නිම කිරීමට යොදා තිබුණු යකඩ කම්බි නියමිත ප්‍රමිතියෙන් යුතු නොවීම නිසා, සියයට 53 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(එ) 2012 ගමනැගුම (අවිච්ඡේද) සංවර්ධන වැඩසටහන යටතේ රු.196,000 ක ප්‍රතිපාදන වැයකර වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බණ්ඩාරනායකපුර ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැගිල්ලක් සඳහා 2013 ජුලි 31 දින සවිකර තිබූ ග්‍රිල් සියල්ල 2014 අප්‍රේල් 08 දින වනවිට මළ බැඳීමට ලක්ව තිබුණි.

(ඒ) 2007 ඔක්තෝබර් 05 දිනැති අංක G.පරි/ගි/1/වි/වි.වැ දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය හා 2006 දෙසැම්බර් 15 දිනැති අංක 19/2006 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ප්‍රකාරව විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වාර්ෂිකව අදාල විශ්‍රාමිකයින් ජීවත්ව සිටින බවට ජීවත්වීමේ සහතිකයක් වසම් භාර ග්‍රාම නිලධාරීන් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පල්ලම, වනාතවිල්ලුව, පුත්තලම හා මහකුඹුක්කඩවල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විශ්‍රාමිකයින් 206 දෙනෙකුගෙන් 2014 මාර්තු වන විටත්, ජීවත්වීමේ සහතික ලබාගෙන නොතිබුණි.

(ඔ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 මැයි 16 දිනැති අංක 04/2011 දරන චක්‍රලේඛයේ විධිවිධාන අනුව, විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන රු.2,000 ක මාසික ජීවන වියදම් දීමනාව විදේශගත විශ්‍රාමිකයින් සඳහා ගෙවිය නොහැකි වුවද, මහවැව සහ හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විදේශගත විශ්‍රාමිකයින් 42 දෙනෙකු වෙත ජීවන වියදම් දීමනාව ලෙස රු.1,036,325ක් ගෙවා තිබුණි.

(ඕ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ නුරාණි කර්මාන්තපුරයේ පිහිටි හෙක්ටයාර් 0.158 ක්වූ විශාල රජයේ ඉඩමක් අංක 4/10/18078 දරන දිගුකාලීන බදුකරය යටතේ 1999 වර්ෂයේ දී බදු දී තිබුණි. එය බදුගත් බදුකරුවකු විසින් ගිවිසුම් ප්‍රකාර කර්මාන්ත ආරම්භ කර නොතිබුණු අතර, ගිවිසුම් ප්‍රකාරව එම ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ක) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක 4/10/15695 දරන දිගුකාලීන බදුකරය යටතේ නුරාණි කර්මාන්තපුරයෙහි පිහිටි අක්කර 05 ක් විශාල ඉඩම් කොටසක් 1999 වර්ෂයේ සිට භුක්ති විඳිමින් සිටි සමාගමක් 2009 වර්ෂයේ දී එම ඉඩමෙන් අක්කර 2 ½ ක් පමණක් ප්‍රමාණවත් හෙයින්, එම ප්‍රමාණය ලබාදෙන ලෙසට කරන ලද ඉල්ලීම අනුව එලෙස කටයුතු කර තිබුණත්, 2010 වර්ෂයේ සිට නියමිත බදු මුදල් ගෙවා නොතිබුණි. බදු මුදල් නොගෙවීම මත ගිවිසුම් අවලංගු කර ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරයා කටයුතු කර නොතිබුණි.

(ඛ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂය තුළ දී සාවද්‍ය ලෙස විශ්රාම වැටුප් ගණනය කිරීම් හේතුවෙන් විශ්‍රාමික නිලධාරීන් 06 දෙනෙකු වෙත රු.226,576 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම මුදල් 2013 වර්ෂයේදී ආපසු අයකර ගෙන නොතිබුණි. 2012 දෙසැම්බර් 20 දිනැති අංක 05/2012 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ

ජනරාල්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව එම වැඩිපුර ගෙවූ 226,576 ක මුදල සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(ග) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බදු ගිවිසුම්වලට එළඹීමෙන් හා බදු මුදල් අයකිරීමෙන් තොරව අක්කර 03 රූඩ් 03 පර්චස් 20 ක් වූ රජය සතු ඉඩම් කොටස් 09 ක් පෞද්ගලික ව්‍යාපාරිකයකුට හා සමුපකාර සමිතියක් වෙත අනවසරයෙන් පරිහරණය කිරීමට ඉඩහැර තිබුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 55 | 47 | 08 | -- |
| තෘතියික මට්ටම | 34 | 15 | 19 | -- |
| ද්විතියික මට්ටම | 998 | 733 | 265 | -- |
| ප්‍රාථමික මට්ටම | 172 | 153 | 19 | -- |
| අභ්‍යාසලාභී උපාධිධාරී | 1,317 | 935 | 382 | -- |
| වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | -- | 07 | -- | 07 |
| **එකතුව** | 2,576 | 1,890 | 693 | 07 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට පුරප්පාඩු 693 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) අනියම් හා තාවකාලික පදනම මත බඳවාගෙන තිබූ සේවකයින් 07 දෙනෙකු වෙනුවෙන් විධිමත් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.